# ඉහළ කොත්මලේ ජලාශ ව්‍යාපෘතිය තුළ සංවර්ධන සන්නිවේදනය භාවිතයේ ගැටලු පිළිබඳ අධ්‍යයනයක් - තලවාකැලේ ප්‍රදේශය ඇසුරින්

*කේ.ඒ.ජේ.එස්. ජයසූරිය[1] ඩබ්ලිව්.ඒ.ටී.ඩී. වික්‍රමරත්න[2] එච්.ඒ.එම්.පීරිස්[3] ජේ.ඊ.එම්.සී.එල්. ගුණරත්න[4]*

ශ්‍රී ලංකාව තුළ ආර්ථික, සමාජීය වසයෙන් බොහෝ ග්‍රාමීය ජනතාවගේ දැත් ශක්තිමත් කිරීම සඳහා මහවැලි ව්‍යාපෘතිය ඉතාමත් වැදගත් කාර්යභාරයක් ඉටු කරමින් ඇත. මෑත කාලයේ දී මධ්‍යම කඳුකරයේ ඉදි කළ අවසන් ජලාශය වසයෙන් නුවරඑළිය දිස්ත්‍රික්කයට අයත් ඉහළ කොත්මලේ ජලාශය පෙන්වා දිය හැකි ය. නාගරික ප්‍රදේශයකට ඉතා ආසන්නව මෙම ජලාශය පිහිටා ඇත. ඉහළ කොත්මලේ ජලාශයට අයත් වර්ග කිලෝමීටර 310කට ආසන්න ජල පෝෂක කලාපය තුළ මේ වන විට සිදු වන විවිධ මානව ක්‍රියාකාරකම් හේතුවෙන් වටිනා සංවර්ධන ව්‍යාපෘතියකට දැඩි බලපෑමක් නිර්මාණය වී ඇත. ජලාශයේ ජල පෝෂක ප්‍රදේශය තුළ පිහිටා ඇති ජනාවාස, කඩ, වීදී හා වගාකටයුතු ඇතුළත් මානව ක්‍රියාකරකම් බහුල ප්‍රදේශය තුළ නිසි පරිදි සංවර්ධන සන්නිවේදනය භාවිත කර තිබේ ද යන්නත්, එකී ප්‍රදේශයන් තුළ සිදු වන සංවර්ධන ක්‍රියාවලිය ඵලදායී ඉලක්කයක් කරා ලඟා කර ගැනීම සඳහා සංවර්ධන සන්නිවේදනය භාවිත කළ හැකි ආකාරය පිළිබඳ වත් අධ්‍යයනය කිරීම මෙම අධ්‍යනයේ ප්‍රධාන අරමුණු ලෙස පෙන්වා දිය හැකි ය. ප්‍රාථමික සහ ද්විතීයික දත්ත මූලාශ්‍රයන් භාවිත කරමින් මෙම අධ්‍යයනය සිදු කර ඇත. සහභාගීත්ව නිරීක්ෂණ ක්‍රමවේදය සහ සම්මුඛ සාකච්ඡා ක්‍රමවේදය භාවිත කර තිබේ. තලවාකැලේ ප්‍රාදේශීය සභා බලප්‍රදේශය සහ නුවරඑළිය ප්‍රාදේශිය සභා බලප්‍රදේශය මෙම අධ්‍යයනය සඳහා තෝරා ගන්නා ලදී. ඒ අනුව ප්‍රශ්නාවලී 90ක් භාවිත කර ප්‍රාථමික දත්ත රැස් කිරීම සිදු කරන ලදී. වයස් කාණ්ඩ 3ක් යටතේ මෙම දත්ත රැස් කරන ලදී. හිරුබට නිම්නය කොත්මලේ ග්‍රන්ථය සහ ඉහළ කොත්මලේ ව්‍යාපෘති යෝජනාව ද්වීතීයික දත්ත මූලාශ්‍රයන් ලෙස භාවිත කරන ලදී. ජල පෝෂක ප්‍රදේශය තුළ පිහිටා ඇති නගර තුළින් දෛනික ව ටොන් 10ක පමණ ඝණ අපද්‍රව්‍යය ප්‍රමාණයක් පරිසරයට එක් වන බව තලවාකැලේ ප්‍රාදේශීය සභාවේ සහ නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ දත්ත තුළ පැහැදිලි වේ. ජලාශය ආසන්න ම ප්‍රදේශයේ පවතින තලවාකැලේ නගරය තුළින් විශාල ඝන අපද්‍රව්‍යය ප්‍රමාණයක් මෙකී ජලාශයට එක් වීම අද වන විට දක්නට ලැබෙන ප්‍රධාන ගැටලුවකි. මෙම ප්‍රදේශයට නිරන්තරයෙන් ඇද හැලෙන වර්ෂාව හේතුවෙන් පරිසරයට බැහැර කර ඇති ඝන අපද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් ජලාශයට රැස් වේ. එය වර්ෂයක් තුළ ටොන් 3650කට අධික ප්‍රමාණයකි. මේ පිළිබඳ ව ජනතාව තුළ නිවැරදි දැනුමක් නොමැති වීම ප්‍රබල ම ගැටලුව බව පැහැදිලි විය. ප්‍රදේශය තුළ දමිළ සහ සිංහල යන ද්විභාෂා භාවිත කරමින් පාරිසරික බලපෑම පිළිබඳ ජනතාව දැනුවත් කිරීමේ අවශ්‍යතාව පැහැදිලි වේ. සංවර්ධනයට සාපේක්ෂ ව නිවැරදි සන්නිවේදනයක් සිදු නොවීම මත මෙම ගැටලු වර්ධනය වී ඇත. සාර්ථක ව්‍යාපෘතියක් ඉතා ඉක්මනින් විනාශ වී යාමට ඉඩ නො දී මේ පිළිබඳ ව සාම්ප්‍රදායික සන්නිවේදනය, දෙපියවර සන්නිවේදනය සහ ජනමාධ්‍ය භාවිතය තුළින් කඩිනමින් ජනතාව සහ රජය සම්බන්ධ වී කටයුතු කළ යුතු ය. සංවර්ධන සන්නිවේදනය භාවිතය සීමා වී ඇති බවත් සංවර්ධන ක්‍රියාදාමය තුළ අහිතකර බලපෑම් ගොඩනැගෙන බවත් එය පාලනය සඳහා සංවර්ධන සන්නවේදනය අවශ්‍යතාව පවතින බවත් පැහැදිලි වේ.

***ප්‍රමුඛ පද:*** මහවැලි ව්‍යාපෘතිය, ඉහළ කොත්මලේ ජලාශය, ඝන අපද්‍රව්‍ය, සංවර්ධන සන්නිවේදනය, මානව ක්‍රියා

[1] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය, මිහින්තලේ. jayasankajs11@gmail.com

[2] මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය,මිහින්තලේ. ssh2020507@ssh.rjt.ac.lk

[3] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. annmaleesha1999@gmail.com

[4] පාරිසරික කළමනාකරණ අධ්‍යයනාංශය, සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර පීඨය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ. chaminilakshika2000@gmail.com